ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 37 දරන
# ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතන පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ඔක්තෝබර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 90 යි  තැපැල් ගාස්තුව ශත 50 යි

1983 අංක 37 දරන ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 06 වන දින.]

එල්. ඩී.—ඕ. 75/75

**ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනය පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 37 දරන ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන, (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය. *(ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)*

## I වන කොටස

**ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනයේ සංයුතිය, අරමුණු, බලතල සහ කර්තව්‍ය**

2. (1) (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද 6 වන වගන්තිය යටතේ තත්කාලයෙහි ආයතනයේ සාමාජිකයන්ව සිටින තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ ද ආයතනයක් පිහිටුවනු ලබන්නේ ය. *(ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනය පිහිටුවීම.)*

(2) එම ආයතනය, (1) වන උපවගන්තියෙන් ඊට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය ; තව ද එකී සංස්ථාගත නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි වන්නේ ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ආයතනයේ සාමාජිකයෝ වන්නාහ.

3. (1) (අ) සමුපකාර සමිතිවලට කළමනාකරණ උපදේශක සේවා සැලසීම ; *(ආයතනයේ පොදු අරමුණු.)*

(ආ) සමුපකාර අංශයට බලපාන කරුණුවලදී වෙනත් සංවිධානවලට සහායවීම සහ එවැනි උපදේශක සේවා සැලසීම ;

(ඇ) සමුපකාර සමිති එකඟව පිළිගනු ලැබූ සේවා කෙරෙන් උද්ගත වන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම පිණිස අනුගාමී සේවා සැලසීම ;

(ඈ) සමුපකාර සමිතිවල කෘෂිකාර්මික, කාර්මික, වාණිජ සහ වෙනත් ව්‍යාපාරවල ශක්‍යතාව සහ එවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් සහ මඟ පෙන්වීම සැලසීම ;

ඒ 09789—12,050 (83/05)

(ඉ) සමුපකාර සමිතිවල කාර්යක්ෂම කළමනාකරණය සඳහා දියුණු කිරීම අවශ්‍යයයි ආයතනයේ උපදේශක සේවා පළපුරුද්දෙන් පෙනී ගොස් ඇති දක්ෂතා වර්ධනය කිරීමට අවශ්‍ය පුහුණුවීමේ වැඩ සටහන් වර්ධනය කිරීම ;

(ඊ) කළමනාකරණ පුහුණු කිරීමේ වැඩ සටහන් වැඩිදියුණු කරනු පිණිස, සමුපකාර අංශයට සහ විශේෂයෙන්ම, ජාතික සහ දිස්ත්‍රික් මට්ටමේ සමුපකාර අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනවලට සහාය සැලැස්වීම ;

(උ) ප්‍රත්‍යෝකයන්, අත්පොත්, ආදර්ශ කාර්ය විස්තර සහ වෙනත් කළමනාකරණ සංනිවේදන ලේඛන වැනි ඉගැන්වීම් උපකරණ නිපදවීම සහ නිකුත් කිරීම ;

(ඌ) සමුපකාර කළමනාකරණය සහ පුහුණු කිරීම හා සම්බන්ධ සම්මේලන සහ සම්මන්ත්‍රණ සම්බන්ධිත කිරීම හා පැවැත්වීම සහ පොත්, ප්‍රකාශන හා සඟරා පළ කිරීම ;

(එ) ආයතනය විසින් ම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි හෝ සමුපකාර සමිති සහ වෙනත් ආයතන ආශ්‍රිතව හෝ සමුපකාර කළමනාකරණයේ සහ පුහුණු කිරීමේ අංශ පිළිබඳ පර්යේෂණ, සමීක්ෂණ සහ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සහ භාර ගැනීම ;

(ඒ) සමුපකාර කළමනාකරණය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ ප්‍රචාරය කිරීම ; සහ

(ඔ) ආයතනයේ කර්තව්‍ය සහ කටයුතු පිළිබඳ තොරතුරු මහජනයාට සහ අදාළ ආයතනවලට ප්‍රචාරය කිරීම ;

ආයතනයේ පොදු අරමුණු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරුණු අතුරින් යම් කරුණක් හෝ ඒ සියලු කරුණු හෝ සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් උපදෙස් සඳහා ආයතනය වෙත යොමු කරනු ලැබිය හැකි වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් ද අමාත්‍යවරයාට උපදෙස් දීම ආයතනයේ කාර්යය වන්නේ ය.

ආයතනයේ බලතල.

4. ස්වකීය අරමුණු සහ කාර්ය ඉටු කිරීම පිණිස සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි බලතල, අයිතිවාසිකම් සහ කර්තව්‍ය ආයතනය සතුව තිබිය යුතු අතර, විශේෂයෙන්, පහත සඳහන් කටයුතු එය විසින් කළ හැකි ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර වූ හෝ ආකාරයකින් අත්කර ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට හෝ ගැනීම නැතහොත් දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඈ) ආයතනයේ සේවා නියුක්තයන් සඳහා ශුභ සාධක හා විනෝද පහසුකම් ඇති කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඇ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඉ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද ආයතනයේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ද අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට කෙළින් ම හෝ අන් අයුරකින් ඇතුළත් වීම සහ ඒවා ඉටු කිරීම ;

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතය ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ නිශ්චය කරනු ලබන ඇපයක් පිට ආයතනයේ කාර්යයන් සඳහා මුදල් ණයට ගැනීම සහ ආයතනය සතු අතිරික්ත මුදල් ආයෝජනය කිරීම ;

(උ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර, උප කරණ සහ වෙනත් යම් ද්‍රව්‍ය ආනයනය කිරීම සහ ආයතනයේ අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා උප කරණ, අරමුදල්, කාර්ය මණ්ඩලය හා වෙනත් ආධාර ලබා ගැනීම ;

(ඌ) ආයතනයේ කටයුතු කාර්යක්ෂම ලෙස කරගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය යයි සලකන කර්තව්‍ය, ආයතනයේ යම් සාමාජිකයකුට, සාමාන්‍යාධිකාරීවරයාට හෝ යම් සේවානියුක්තයකුට හෝ අනුයෝජිතයකුට පැවරීම ;

(එ) ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධන ප්‍රමිති ඇති කිරීම, ඒ කාර්ය සාධන අගැයීම සහ ඒ පිළිබඳව සාධාරණ ලෙස ක්‍රියා කිරීම ;

(ඒ) ආයතනයේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ගාස්තු අය කිරීම, මුදල් භාර ගැනීම සහ ගෙවීම ; සහ

(ඔ) ආයතනයේ අරමුණු හා කර්තව්‍ය මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

අමාත්‍යවරයාගේ විධාන යටතේ ආයතනය විසින් තම බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

5. ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි හා අරමුණු මුදුන්පත් කර ගැනීමෙහි ලා, ආයතනය විසින් ආණ්ඩුවේ පොදු ප්‍රතිපත්ති වලට හා ඒ ප්‍රතිපත්තිවලට අදාළව අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ විධානවලට අනුව ක්‍රියා කළ යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය.

6. (1) මෙහි මින් මතු “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක්, ආයතනයට තිබිය යුතු ය :—

(අ) සමුපකාරය පිළිබඳ කාරණා, පරිපාලනය, බැංකු සහ මූල්‍ය කටයුතු, කෘෂිකර්මය, කර්මාන්ත, අලෙවි කිරීම හා බෙදා හැරීම පිළිබඳව පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයන් පස් දෙනෙක් ; සහ

(ආ) නිල බලයෙන් පත්වන පහත දැක්වෙන සාමාජිකයන්, එනම්—

(i) ශ්‍රී ලංකාවේ ජාතික සමුපකාර සභාවේ සභාපතිවරයා ; සහ

(ii) සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා.

(2) යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් හෝ යම් තැනැත්තකු මන්ත්‍රීවරයකු වුවහොත් ; හෝ

(ආ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිහි විකල තැනැත්තකු යයි විනිශ්චය කරනු ලැබුව හොත් ; හෝ

(ඇ) නිදහස් නොවූ, බුන්වත් හෝ බංකොලොත් තැනැත්තෙක් නම් ; හෝ

(ඈ) චරිත දූෂණාත්මක වරදක් වන්නා වූ ද මාස හයක් ඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි වූ ද වරදකට වරදකරු කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් ක්‍රියා කරගෙන යාමට නුසුදුස්සෙක් වන්නේ ය.

(3) (අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ, යම් සාමාජිකයකු මිය යන හෝ ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඒ උපවගන්තියේ ඒ ඡේදයෙහි විධිවිධාන සැලකිල්ලට ගෙන, එසේ මිය යන, ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයා වෙනුවට සාමාජිකයකු වශයෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඔහු කලින් ඉල්ලා අස් වුවහොත් නැතහොත් මිය යාමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ සිය ධුරය හිස් වුවහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කොටස සඳහා ධුරය දරන්නේ ය.

(4) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකුට, රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තම ධුරයෙහි කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

*අධ්‍යක්ෂ මණ්ඩලයේ ධුර කාලය.*

7. (1) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සෑම සාමාජිකයෙක් ම, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ඔහුගේ ධුරය කලින් හිස් කරන්නේ නම් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දරන්නේ ය.

(2) නිල බලයෙන් පත් වන මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් ම, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබුවේ යම් තන තුරක් දැරීමේ හේතුවෙන් ද ඒ තනතුර ඔහු විසින් දරන තාක් කල් සාමාජික ධුරය දරන්නේ ය.

*මණ්ඩලයේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයා සතු බලය.*

8. (1) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ, මණ්ඩලයේ යම් සාමාජිකයකු ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින්, අමාත්‍යවරයාගේ මනාපය පරිදි ඉවත් කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නියම යක් කරනු ලැබුවේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා විසින්, ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිය ධුරය හිස් කළ යුතු ය.

*මණ්ඩලයේ සාමාජිකයකු ඉල්ලා අස්වීම.*

9. නිල බලයෙන් පත් වූ සාමාජිකයකු නොවන, මණ්ඩලයේ සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත යොමු කොට යවන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

*මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කරනු ලැබීමට සුදුසු වන බව.*

10. 8 වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයකු නොවන, සිය ධුරය හිස් කරන යම් සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

*පුරප්පාඩුවක් තිබිය දී වුව ද ආයතනයට ක්‍රියා කළ හැකි බව.*

11. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් ආයතනයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල ලෙස සලකනු නොලැබිය යුතු ය.

*මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික.*

12. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් මණ්ඩල යේ සියලු සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

*මණ්ඩලයේ රැස්වීම්.*

13. මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් ද ඒ රැස්වීම් සඳහා වූ ගණපූරණය සම්බන්ධයෙන් ද, ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

*මණ්ඩලය විසින් ආයතනයේ කටයුතු පරිපාලනය කළ යුතු බව.*

**14.** මණ්ඩලය විසින් ආයතනයේ කටයුතු පරිපාලනය කළ යුතු අතර, එහි බලතල ක්‍රියාත්මක කිරීම කළ හැකි ය; තව ද ආයතනයේ කාර්ය ඉටු කිරීම ද මණ්ඩලය විසින් කළ යුතු ය.

*මණ්ඩලයේ බලතල හා කාර්ය පැවරීම.*

**15.** (1) සභාපතිවරයාට, මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ මණ්ඩලයේ යම් සේවානියුක්තයකුට හෝ මණ්ඩලය විසින් එහි බලතල හා කාර්ය අතුරින් කිසිවක් පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල හෝ කාර්ය අතුරින් කිසිවක් පවරනු ලැබූ සභාපතිවරයා, මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ සේවානියුක්තයකු විසින් එසේ පවරනු ලැබූ බලතල හා කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හෝ කළ යුතු ය.

*මණ්ඩලයේ සභාපතිවරයා.*

**16.** (1) සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයාගේ ධුර කාලය අවුරුදු තුනක් වන්නේ ය:

එසේ වුව ද, සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යොමු කොට යවනු ලබන ලිපියකින් සභාපති ධුරයෙන් කලින් ඉල්ලා අස්විය හැකි ය; නැතහොත් අමාත්‍යවරයා විසින් සිය මනාපය පරිදි සභාපතිවරයාගේ පත්වීම අවසන් කළ හැකි ය.

(3) රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා හෝ සිය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට සභාපතිවරයා තාවකාලිකව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් සාමාජිකයන්ගෙන් කෙනකු පත් කරනු ලැබිය හැකි ය.

*රැස්වීම්වල මූලාසනය දැරීම.*

**17.** (1) සභාපතිවරයා පැමිණ සිටින මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විට මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් බහුතර සංඛ්‍යාවක් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දරන සභාපතිවරයාට හෝ තැනැත්තාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

*ආයතනය විසින් එළඹීමට අදහස් කරන ගිවිසුමකට තමාට ඇති සම්බන්ධතාව මණ්ඩලයේ සාමාජිකයන් විසින් හෙළිදරව් කළ යුතු බව.*

**18.** ආයතනය විසින් එළඹීමට අදහස් කරන ගිවිසුමකට කෙළින්ම හෝ අන් අයුරකින් හෝ සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින් සිය සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී හෙළිදරව් කළ යුතු ය. එම හෙළිදරව් කිරීම මණ්ඩලයේ රැස්වීම් වාර්තාවල සටහන් කළ යුතු අතර, මණ්ඩලය විසින් ඒ ගිවිසුම සම්බන්ධයෙන් කෙරෙන යම් සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

*ආයතනයේ මුද්‍රාව.*

**19.** (1) ආයතනයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන තැනැත්තකුගේ භාරයෙහි තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයා සහ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී මිස, ආයතනයේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඒ දෙදෙනා පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් තැබිය යුතු ය.

(3) ආයතනයේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍රවල හා ලේඛනවල රෙජිස්ටරයක් මණ්ඩලය විසින් තබා ගත යුතු ය.

(4) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ආයතනයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම

ආයතනයේ සාමාන්‍යාධිකාරිවරයා පත් කිරීම.

**20.** (1) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය ඇතිව, ආයතනයේ කාර්ය මණ්ඩලයට සාමාන්‍යාධිකාරිවරයකු පත් කළ යුතු ය.

(2) ආයතනයේ සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් යම් තැනැත්තකුට දෙන ලද පත්වීම අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය ඇතිව මිස, අවසාන නොකළ යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන පත්කිරීම සහ ඔවුන් පුහුණු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය සතු බලතල.

**21.** (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව—

(අ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වෙනත් නිලධරයන් සහ සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම;

(ආ) ආයතනයේ කාර්ය මණ්ඩලය සේවයෙන් පහකිරීම සහ කාර්ය මණ්ඩලයේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ඇ) එම කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම;

(ඈ) එම කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීම; සහ

(ඉ) ආයතනයේ වැඩ කටයුතු කරගෙන යාම පිණිස අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම සඳහා අන් තැනැත්තන් විසින් පහසුකම් සැලසීම ඇතුළුව, ආයතනය විසින් සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ගේ දක්ෂතා හෝ ආයතනයේ උපකරණවල කාර්යක්ෂමතාව හෝ ඒ උපකරණ ක්‍රියා කරවන ආකාරය හෝ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා කවර වූ හෝ දෙයක් කිරීම

මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරුණු සියල්ල හෝ එයින් යම් කරුණක් හෝ සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට වෙනත් සේවාවලින් නිලධරයන් පත් කිරීම.

22. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයෙහි යම් නිලධර යකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයෙහි යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතෙහි 13 (2) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 (3) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) (අ) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ඇතිව, අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය එකඟවන නියම හා කොන්දේසි මත, ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව හෝ පත්කරනු ලැබිය හැකි ය.

(ආ) යම් තැනැත්තකු (අ) ඡේදය යටතේ ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව හෝ තාවකාලිකව හෝ පත් කරනු ලැබූ අවස්ථාවක එම කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු ද යටත් වන්නේ ය.

(5) නියමිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹුණු යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් සේවා කාලයක්, ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ සේවා නියුක්තයන් විසින් වෙනත් තැනැත්තන්ට සේවා ඉටු කිරීම.

23. ආයතනයේ කිසිම නිලධරයකු, මණ්ඩලයේ පූර්ව අනුමතිය නොමැතිව, වෙනත් කිසි තැනැත්තකුට හෝ තැනැත්තන්ට, ගෙවීම් සහිත සේවා ඉටු නොකළ යුතු ය.

ආයතනයේ සාමාජිකයන් හා සේවා නියුක්තයන් රාජ්‍ය නිලධරයන් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

24. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ආයතනයේ සියලුම සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

25. ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධි විධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

## III වන කොටස

## මුදල්

26. (1) ආයතනයට ආයතනයේ ම අරමුදලක් විය යුතු ය.

ආයතනයේ අරමුදල.

(2) (අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදාන හෝ ණය වශයෙන් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) දේශීය හෝ විදේශීය ආයතනවලින් ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල්

ආයතනයේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල්

ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) ආයතනයේ අරමුදලේ මුදල්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් බැංකුවක හෝ බැංකුවල තැන්පත් කළ යුතු අතර ඒ එක් එක් බැංකුවෙහි ඇති ආයතනයේ ගිණුම ආයතනයේ සංස්ථා නාමයෙන් තිබිය යුතු ය.

(5) ආයතනයේ අරමුදලින් කරනු ලබන යම් ගෙවීමක් මණ්ඩලයේ අනුමතය ඇතිව කරනු ලැබිය යුතු ය :

එසේ වුවද මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණය කට වැඩි නොවන මුදලක්, යම් එක් මාසයකදී ආයතනය වෙනුවෙන් සාධාරණ වියදමක් ලෙස වැය කිරීමට මණ්ඩලය විසින් මණ්ඩලයේ සභාපතිවරයාට හෝ මණ්ඩලයේ වෙනත් සේවානියුක්තයකුට බලය දිය හැකි ය.

ගිණුම් විගණනය කිරීම.

**27.** (1) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම පිළිබඳව වූ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

## IV වන කොටස

## පොදු විධිවිධාන

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.

**28.** (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍යවන්නා වූ ද යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ ඒ දේපළ අත්කර ගෙන ආයතනයට පවරනු ලැබිය හැකි ය.

(2) ආයතනය සඳහා යම් නිශ්චල දේපළක් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු යම් මුදලක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රජයේ චංචල හා නිශ්චල දේපළ ආයතනයට ලබා දිය හැකි බව.

**29.** රජයේ යම් චංචල හෝ නිශ්චල දේපළක සන්තකය හා පාවිච්චිය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍ය වරයා විසින් ආයතනයේ කාර්ය සඳහා ආයතනය වෙත පවරා සතු කර දිය හැකි ය :

එසේ වුව ද, රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් රජයේ යම් නිශ්චල දේපළක් කෙරෙහි බලපාන කිසිම නියමයක් නොකළ යුතු ය :

එසේම තවදුරටත් රජයේ යම් චංචල දේපළක පාලනය ඇත්තා වූ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් ඒ දේපළ කෙරෙහි බලපාන්නා වූ නියමයක් නොකළ යුතු ය.

ආයතනයේ ප්‍රයෝජනය සඳහා රජය විසින් ගොඩනැගිලි ආදිය ලබා දිය හැකි බව.

**30.** ආයතනයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් රජය විසින් ආයතනයට සපයා දිය හැකි ය.

පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ හෝ පවරනු ලබන කාවු සම්බන්ධයෙන් ආරක්ෂාව.

**31.** (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යයි සලකනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; නැතහොත්

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යයි සලකනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඔහු විසින් ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් බව අධිකරණය විසින් පිළිගත හොත්, ඒ තැනැත්තා විසින් එහි ලා දරන ලද වියදම් කිසිවක්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**32.** මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත් කරන ලද කිසිම නඩුවක දී මණ්ඩලයේ සාමාජිකයකුට පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය. මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**33.** (1) රීති සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කරුණු හෝ යම් කරුණක් හෝ සම්බන්ධයෙන් ආයතනය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති සෑදීමට ආයතනය සතු බලය.

(2) ආයතනය විසින් සාදනු ලැබූ කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තෙක්, බලාත්මක නොවන්නේ ය.

**34.** මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් විශේෂ හෝ සාමාන්‍ය විධාන ලිඛිතව දිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය. මණ්ඩලයට, විශේෂ විධාන හෝ සාමාන්‍ය විධාන කිරීමෙයි ලා අමාත්‍යවරයා සතු බලය.

**35.** (1) ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීමේ දී තමා විසින් ලබා ගන්නා ලද තොරතුරු කිසිවක්, මණ්ඩලයේ කිසිම සාමාජිකයකු විසින් හෝ ආයතනයේ කිසිම නිලධරයකු හෝ සේවකයකු විසින්, ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා හැර යම් තැනැත්තකුට එළිදරව් කරනු නොලැබිය යුතු ය : රහස්‍යතාව.

එසේ වුවද, වෙනත් පාර්ශ්වකරුවකු සමග ඇති කර ගනු ලැබූ යම් එකඟවීමකින් රහස්‍ය ලෙස සැලකීමට ආයතනය බැඳී ඇති කරුණු වලට අදාළ කිසිම තොරතුරක් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ එළිදරව් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

"ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනය" යන වචන භාවිත කිරීම සීමා කිරීම.

**36.** (1) යම් තැනැත්තකු විසින් යම් කටයුත්තක්, වෙළෙඳ ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාමේ දී "ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනය" යන වචන ඇතුළත් අභිධානයක්, නැතහොත් වෙනත් එවැනි වචන භාවිතය කිරීමෙන් ඒ කටයුත්ත, වෙළෙඳ ව්‍යාපාරය, කර්මාන්තය හෝ ව්‍යාපෘතිය "ශ්‍රී ලංකා සමුපකාර කළමනාකරණ ආයතනය" සමග සම්බන්ධව හෝ එහි අනුමතය ඇතිව නැතහොත් එහි අධිකාරය යටතේ හෝ කර ගෙන යන බව ගම්‍යමාන වන පරිද්දෙන් ඒ වෙළෙඳ ව්‍යාපාරය, කර්මාන්තය හෝ ව්‍යාපෘතිය, ආයතනය හැර, වෙනත් තැනැත්තකු විසින් පවත්වා ගෙන යාම අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මිස නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

වැරදි සඳහා දණ්ඩන.

**37.** මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක් ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට මාස හයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහස් පන්සියයක් නො ඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

සමුපකාර කළමනාකරණ සේවා මධ්‍යස්ථානයේ ගිවිසුම්, වත්කම්, බැරකම්, ආදියට ආයතනය අනුප්‍රාප්ත වන බව.

**38.** (1) නියමිත දින සිට, ආයතනය, 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ සමුපකාර කළමනාකරණ සේවා මධ්‍යස්ථානයේ අනුප්‍රාප්තිකයා වන අතර, ඒ අනුව, නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි පැවැති, සමුපකාර කළමනාකරණ සේවා මධ්‍යස්ථානයේ සියලු ගිවිසුම්, බැඳීම්, වත්කම්, අයිතිවාසිකම්, බැරකම්, කාර්ය මණ්ඩල සහ උපකරණ, ආයතනයේ ගිවිසුම්, බැඳීම්, වත්කම්, අයිතිවාසිකම්, බැරකම්, කාර්ය මණ්ඩල සහ උපකරණ වශයෙන් සලකනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සමුපකාර කළමනාකරණ සේවා මධ්‍යස්ථානය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබූ නියමිත දිනයෙහි විනිශ්චයට භාජනව ඇති සියලු සිවිල් නඩු, නඩු, අපරාධ නඩු, අභියාචන හෝ වෙනත් නෛතික කටයුතු, ආයතනය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ආයතනය විසින් හෝ ඊට විරුද්ධව පවත්වා ගෙන යාම හෝ බලාත්මක කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

**39.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සමුපකාර සමිතිය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරන ලදැයි සැලකෙන හෝ සමිතියක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත හෝ 1982 අංක 17 දරන සමාගම් පනත හෝ යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්ද වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැත හොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්. මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.